ලිංගික අපරාධයක් පිළිබඳව වාර්තා කිරීමේදී ඇතැම් විට මාධ්‍ය මගින් කෙළෙසීම හෝ දූෂණය වැනි යෙදුම් ඒ සඳහා භාවිතා කරනු දැකිය හැකි වේ. නමුත්, කෙළෙසීම හෝ දූෂණය වැනි යෙදුම් මගින් වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය වන හෙයින් සහ එම යෙදුම් හා ගර්හාත්මක ආකල්පයක් බැඳී ඇති බැවින්, ලිංගික අපරාධය හෝ ලිංගික අපයෝජනය වැනි යෙදුමක් එවැනි අවස්ථාවන් සඳහා වඩාත් උචිත යැයි අපි පවසමු.
දිවයින පුවත්පතේ (07/07) එකම පිටුවක, බාල වයස්කාර ලිංගික අපයෝජනයන් දෙකක් සම්බන්ධයෙන් වූ පුවත් වාර්තාවන් දෙකක එම ලිංගික අපයෝජනයන් හැඳින්වී තිබුණේ පහත අයුරිනි. එක් පුවත් වාර්තාවක "අපයෝජනය" ලෙසින් සඳහන්ව තිබූ නමුත්, අනෙක් පුවත් වාර්තාවේ සඳහන් වී තිබුණේ "කෙළෙසූ" යන්නයි.
මෙවැනි යෙදුම් සහ ඒවාට කළ හැකි සමාජ බලපෑම සම්බන්ධයෙන් මාධ්‍ය වඩාත් සංවේදී විය යුතු බවද අපි මෙසේම පවසමු.
#MediaEthicsSL #lka #sinhalanews #Divaina